## පෙබරවාරි 4

මේ ගතවෙලා යන්නේ අපේ 68 වන ජාතික නිදහස් දිනය කියලයි ප්‍රකාශවෙන්නෙ. හැම නිදහස් දිනයක්ම අභිමානවත් එකක් තමයි පරාධීන බවින් මිදුන ජාතියකට. ඒ නිසා ඒ දිනය පපුවට වැදෙන දිනයක් වෙන්න ඕනෙ. එහෙම කරගන්න ඕනෙ. ඒකෙ වගකීම රටක පාලකයන්ට වගේම පුරවැසියන්ටත් පැවරෙනවා. චූටි මල්ලිගෙ ජීවිතෙත් නිදහස්



දින කීයක් නම් පහුකළාද? ඒත් ඒ එකක්වත් ඇඟට දැනුණ බවක් නම් මතක නැහැ. දැනිල තිබුණෙ පෙබරවාරි 4 නිදහස් චාරිත්‍රය කරන දිනය කියලා විතරමයි.

අපේ තාත්තලා නම් 48 දි නිදහස් දිනය ඉහළින් සැමරුවාලු. ඊට පස්සෙ පොඩි අයියලගෙ කාලෙ 72 දි ජනරජයක් බවට පත්වෙලා පෙබරවාරිය මැයි වලට ගිහින් නියම විදිහට යටත් විජිතවාදයෙන් මිදුනා කියලා ජයටම සැමරුවාලු. ඊට පස්සෙ ආණ්ඩු පෙරළියෙන් මැයි වල ඉඳලා නිදහස ආපහු පෙබරවාරියටම ආවානෙ. ඒවා තමයි අපි දැක්කෙ.

අපේ ජීවිත කාලෙදි ටිකක් ඇඟට දැනෙන ඇඟට වැදෙන විදිහට රත් වුණ නිදහස් දිනයක් දැක්කේ මේ පාර. මොකද ආණ්ඩුව නිදහස් දිනයත් එක්ක කරපු වැඩ පිළිවෙල නිසා රට උණුසුම් වෙලා නිදහස ගැන මිනිසසු කතා කරන්න ගත්තනෙ. ඒක කාලෙකට පස්ස සිදුවුණ හොඳ දෙයක්. කට්ටියක් වර්ජනය කළා. තවත් කට්ටියක් කලුකොඩි දාන්න ට්‍රයි කරලා පස්ස බිම ඇනගත්තා. තවත් අය පෙළපාලි ගියා. ඇත්තටම ඒකෙන් වුණේ මිනිස්සු මේ නිදහස ගැන කතා කරලා යට ගිය මතක යළි ආවර්ජනය කරන්න පටන් ගැනීමක්. මේක ඉන්න දෙමළ මිනිසසුන්වයි මුස්ලිම් මිනිස්සුන්වයි කන්න හදන වෙලාවෙ අපි 48 යම් නිදහසක් ලැබුණද ඒ සඳහා මේ සුළු ජාතිකයන්ගේ ද සහභාගිත්වයක් තිබුණ බව යළිත් කතාකරන්නටත් ඒ කාරණය නොදැන හිටපු අයට ඒ පිළිබඳව දැනුම්වත් වෙන්නත් මේ කතිකාව ඇතුළෙ ඉඩක් විවර වුණා. ඒක භාග්‍යයක්. මොකද පහුගිය කාල වල නිදහස සැමරුණේ වෙනත් ජාතිකයන් මේ රටේ නැතුව වගේනෙ. ඒකයි චූටි මල්ලි මේ දිනයට මේ සැරේ මේ තරම් කැමති. ඒකම ශ්‍රී ලාංකික ජාතිය ලෙස එක්ව හිතන්නට හැමෝටම ලැබුණ අවස්ථාවක් ඒක. ඒක පපුවලට වැදුණ නිසා තමයි උතුරෙ මහ ඇමති විග්නේෂ්වරන් යාපනයේ නාග විහාරයට ගිහින් බුදුන් වැඳලා කිව්වෙ "සිංහල සහෝදරවරු අප දිහාට එක අඩියක් තියනවානම් අපි ඔබ දිහාට අඩි දහයක් තියන්නම්" කියලා. හැමදේකම වැරදි දකින්න බලා ඉන්න බලලෝභී කොටස මොනවා කිව්වත් මේවා රටක් හැටියට ඉදිරියට යන්න වැටෙ හොඳ අඩිතාලමක්.

ඉතින් නිදහස ගැන කතා කළ නිසා මේකත් කියන්න ඕනෙ. කොච්චර නිදහස ගැන පම්පෝරි ගැහුවත් අපට නිදහස් මිනිසුන් විදිහට ජීවත්වන්නට සැබෑම නිදහස ලැබුණෙ කවදද කියලා දැනගන්න ඕනෙ නම් කොල්බෲක් කොමිෂන් සභා වාර්තාව හොයාගෙන කියවන්න. එතකොට දැනෙයි මිනිසුන්ගේ නිදහස හරියටම ලැබුණෙ කවදද කියලා.

## ජාතික ගීය

තම තමන්ගෙ ජීවිත කාල වලින් හරි අඩකටත් වඩා කාලයක් ඉන්දීය හෝ බටහිර චිත්‍රපට, ගීත, පොත් වලට අබේ ඊෂාවෙන් අනුකරණ තාල පද රඟපෑම් වෙස්ගැන්වීම් යොදාගෙන නිර්මාණ කරලා ඒවා රස විඳපු අප සහ පෙර පරම්පරාවේ ජාති ආලකාරයන්ට අපේ ජාතික ගීය ඒ තනුවටම ඒ තේරුමටම දෙමළ භාෂාවෙන් අපේම රටේ දරුවන් ගයන එක ගැන මාර ඇම්මක්නෙ යකෝ තිබුණෙ. ලංකාවෙ දේවල් ගැන නොලියන්න හිතුවත් මේ මේ රොත්ත කරපු කලබැගෑනිය නිසා නොලියා බැරිවෙනවා. මෙහෙම මරි මෝඩ රැළක් ලංකාවෙ ඉන්නවද කියලවත් හිතාගන්න බැහැ. හොර දේශප්‍රේමී නඩේ නම් තව කමක් නැහැ. රටේ ඉන්න බුද්ධිමතුන්




යයි කියාගන්නා සමහර මිනි සුන්ටත් මේ අපට තේරෙන දේ නොදැනෙන්නෙ ඇයිද මන්දා? අපේ රටේ දරුවෝ මේ ජාතික ගීය ගැයීම අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණයක් කියලා බෙරිහන් දෙනවා මිසක් එහෙම කුමන්ත්‍රණයක් ගැන ඔප්පු කරන්න මේ කුලප්පුවෙලා දඟලන මිනිසුන්ට පුලුවන්ද? කොළඹ දෙමළ මුස්ලිම් දරුවෝ තමන්ට තේරෙන භාෂාවෙන් "නමෝ නමෝ තායේ" කියන කොටත් කිලිනොච්චියේ පරන්තන් වල දරුවෝ "ශ්‍රී ලංක ා මාතා" කියලා සිංහලෙන් කියනකොටත් රසවිඳින්න සතුටුවෙන්න බැරි අපි අර සතෙකුගෙන් පැවත එනවයි කියලා අදහන සත්තුන්ට විතරයි කියලයි චූටි මල්ලිට හිතෙන්නෙ. දශක ගණනාවක් එකිනෙකා මරාගත්ත ජනකොට්ඨාශ දෙකක් එක ගීතයක් එකම කොඩියක් යට ගයනකොට අපට දැනෙන්නේ ශක්තියක් - ආරක්ෂිත බවක් නෙවෙයිද? මේ හැඟීම පටු අවස්ථාවාදයකට යට කරන්න ඉඩ දෙන්න ඕනෙද? ආණ්ඩුව ගැන කොයිතරම් ගැටළු තිබුණත් මේ වගේ ඉදිරිගාමී වැඩ අපි අනුමත කළයුතුයි. ඒ වෙනුවෙන් පෙනී සිටිය අය වෙනුවෙන් චූටි මල්ලි කොන්දේසි විරහිතව නැගී සිටින බවත් ලියන්න කැමතියි.

## ප්‍රසංග ප්‍රසංග

ජනේරුවෙන් පටන් අරන් අගෝස්තු වෙනකල් කාලට තුළ ඔස්ට්‍රේලියාව එළැඹෙන්නෙ ප්‍රසංග වසන්තයක්ද නැත්නම් වසංගතයක්ද කියලා තෝරාබේරාගන්න බැරුව ඉන්නෙ මං. මේ හැම සන්දර්ශනයක්ම බලන්න ආසා වුණත් බලන්න යන්නෙ කොහොමද?

මේ සමහර ප්‍රසංග සංවිධානය වෙන්නෙ මොකක් හරි වැදගත් ව්‍යාපෘතියකට ආධාර එකතුකරගන්න. තවත් ඒවා පුද්ගලික ව්‍යාපාර. මොන ආකාරයකින් සංවිධානය වුණත් මේ ප්‍රසංග වැස්ස නිසා ලංකාවේ කලාකාරයන්ට යම් ප්‍රතිලාභ ලැබෙන එක සතුටක්. සංවිධායකයන් ආදායමක් ලබා ගැනීමත් සතුටක්. ඒත් ප්‍රේක්ෂකයන් වෙච්ච අපි? අපි නිකම් අතරමං වෙලා වගේ කියලයි මට දැනෙන්නෙ. අනේ මන්දා.



## හොරු ආරක්ෂා කිරීම

පහුගිය ජනාධිපතිවරණය කාලෙ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්තය කිව්වෙ "මට මේ දේ වුණේ හොරු ආරක්ෂා කළ නිසයි. මගේ ගාව හිටපු වැරදි කරපු අයට එරෙහිව මං නීතිය ක්‍රියාත්මක කළේ නැහැ. මං හොරු ආරක්ෂා කළා" කියලයි. ඊයෙ පෙරේදාත් කිව්වා ප්‍රේමදාස



ජනාධිපතිතුමාගෙ දුව හොර සල්ලි ගහලා අහුවෙලා එයා ඒක ෂේප් කරලා දැම්මා කියලා.

දැන් ඉන්න ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්තය කියන්නෙ "මොන වරදක් කරලා තිබුණත් හිටපු ජනාධිපති මහින්ද මහත්තයවයි එයාගෙ නෝනාවයි හිරේ දමන්නෙ නම් නැහැ" කියලයි.

මේ පාලකයන් දෙන්නම කොයි තරම් වැරදිද කියලා පේන්නෙ මට විතරයිද මන්දා. කෙනෙක් හොරෙක් නම් මොන පක්ෂෙන් ආවත් මොන බලවතෙක් වුණත් ඔහුට හෝ ඇයට එරෙහිව නීතිය ක්‍රියාත්ම විය යුතුමයි. තරාතිරම නෙනාබලා හොරුන්ට දඬුවම් දිය යුතුමයි. ඒහෙම නොකර ඉන්න කිසිම පාලකයෙකුට අයිතියක් නැහැ. වරදට දඬුවම් දුන්නට පස්සේ පොදු සමාවක් දෙනවා නම් එක් වෙනම කතාවක්.

## රත්න ශ්‍රී

සාහිත්‍යය ගැන මට තියෙන්නෙ මහා විශාල දැනුමක් නෙවෙයි කියලා මා කලිනුත් ලියලා තියෙනවා. ඒත් මම සාහිත්‍ය නිර්මාණ රස විඳිනවා. පුංචි කාලෙ නුවර පොත් සාප්පු පීරමින් නවකතා කෙටිකතා පොත් හෙව්ව අපි තරුණ වියට එද්දි කවියටත් ආදරේ කරන්න ගත්තා. කවියක් කියවලා රසි විඳින් ඉගෙන ගත්තෙ කවුරුත් කියා දීලා නෙවෙයි. නිතර නිතර ඒවා කියවීමෙන් ලැබුණ අවබෝධය නිසා වෙන්න ඇති. ලංකාවේ කවියන් අතර ඉහළින්ම ඉන්න මහගම සේකර මිය ගියේ මං කුඩා සන්දියෙ. ඒ වෙනකොට මට එතුමා ගැන මහා ලොකු වැටහීමක් තිබුණෙ නැහැ. ඒත් ගැටවරයන් හැටියට මහගම සේකර ලියූ කවි කියවද්දි මේ මහා ලේඛකයා මේ තරම් අඩු වයසකින් අප හැර ගියේ ඇයිද කියල වේදනාව දැනුණා.

සේකර නැති අඩුව පිරිමහන්න කවියන් කීපදෙනෙක්ම ඉන්පස්සෙ ලංකාවෙ බිහිවුණා. ඒ අය අතරින් රත්න ශ්‍රී සුවිශේෂයි. හේතුව ඔහු ලියූ කවි අපේ හිත්

තර්කයේදී ඔබ ඔබා තබන්නට
කටපාඩම් කරගත් දේ මට නැත
පිළිසඳරේ ඔබ සතුටු කරන්නට
කලින් ගොතා ගත් සිනා කතා නැත

උදේ රැයින් ඔබ හමුවූ විට හෝ
සවසට ඔබගෙන් වෙන්වී යනවිට
චාටු සිනහවෙන් මුව සරසා ගෙන
ඔබට සුබ පතන්නට
අමතක විය හැක මට

එනමුත් මා ගැන අහිතක් නොසිතන්
මම මගේ හදවතින්
ඔබේ හද දකින විට
බුද්ධියෙ කන්නාඩිය ඇස ලාගෙන
නළල හකුළුවා
පණ්ඩිත මානෙන්
මා දෙස නොබලන්
ඔබට මා තුළ තිබෙන සෙනෙහස
එවිට නොහැකියි ඔබට දක්නට.

\- මහගම සේකර

වලට බොහොම සමීප වීමයි. රත්න ශ්‍රී ගෙ කවි තේරුම් ගන්න ප්‍රහේලිකා විසඳන්න ඕනෙ නැහැ. කියවද්දිම අපට ඒ කවි දැනෙනවා. ඒ නිසයි අපි රත්න ශ්‍රීට ආදරේ කරන්න පටන්ගත්තෙ.

ගිය අවුරුද්දෙ රත්න ශ්‍රී ආව වෙලාවෙ මං ඒ ප්‍රසංගයට ගියා. එතුමා එක්ක වචනයක් කතා කරන්න ලැබුණ එකත් මට සතුටක්. රත්න ශ්‍රී ආයෙම එනවා කියලා දැනගත්තම චූටි මල්ලිට ඇති වුණේ ලොකුම සතුටක්. චූටි මල්ලි මග බලාගෙන ඉන්නෙ මේ මහා කවියා ආයෙම වතාවක් දැක බලාගෙන වචනයක් කතා කරන්න.

**චූටි මල්ලි**